කුලියාපිටිය නගර සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
---------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 සැප්තැම්බර් 30 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සභා බල ප්‍රදේශයට අදාලව භූගෝලීය දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය ආරම්භයට ණය හිමියන් යටතේ රු.83,175 ක ප්‍රතිපාදනයක් පැවති අතර, වර්ෂය තුල ඒ සඳහා ගෙවීමට වූ රු.300,000 ක ප්‍රමාණයෙන් ප්‍රතිපාදනය නොවූ රු.216,825 ක මුදල ඉකුත් වර්ෂයට අදාල ගැලපුම් යටතේ ගිණුම් ගත නොකර, සමාලෝචිත වර්ෂයේ සංග්‍රහ වියදම් වලට රු.165,290 ක් හා වෙනත් දෙපාර්තමේන්තු ගෙවීම් වලට රු.51,535 ක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල රු.345,517 ක කර්මාන්ත වියදම් ගිණුම් ගතකර නොතිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම හා වර්ෂය අවසානයට ණයහිමියන් රු.345,517 කින් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රාග්ධන ආධාර ලෙස ගිණුම් ගතකර තිබූ රු.7,948,153 ක මුදල තුල 2014 වර්ෂයට අදාල රු.2,669,440 ක්ද ඇතුලත්ව තිබීමෙන් වර්ෂයට අදාල ප්‍රාග්ධන ආදායම හා වර්ෂය අවසානයට ප්‍රාග්ධන ආධාර ණයගැතියන් එකී අගයෙන් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂය අවසානයට පුස්තකාල පොත් ශේෂය රු.312,629 ක් අඩුවෙන් හා අතැති තොග ශේෂය රු.13,342,079 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඉ). ඉදිරි වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලද රු.261,982 ක් වූ වරිපනම් බදු ආදායම් කලින් ලද ආදායම් ණය හිමියන් ලෙස ගිණුම් ගත නොකර සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු වරිපනම් බදු ආදායම් ණය ගැතියන්ගෙන් අඩුකර දක්වා තිබුණි.

(ඊ). කඩ කුලී ලෙස සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු.632,500 ක මුදල ආදායම් යටතේ හා ණයගැතියන් යටතේ ගිණුම් ගතකර නොතිබුණි. එමෙන්ම 2014 වර්ෂයේ සිට ඉදිරියට ලැබිය යුතු කඩකුලී ණයගැතියන් රු.880,000 ක් ගිණුම් සටහන් මගින් හෙළිදරව් කර නොතිබුණි.

(උ). සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.1,779,497 ක ස්ථාවර තැන්පතුව හා එතුල වූ රු.198,390 ක පොලී ආදායම්, ගිණුම් ගතකර නොතිබුණි. වර්ෂය අවසානයට පැවති රු.8,069,261 ක ස්ථාවර තැන්පතුව හා එතුල වූ රු.994,499 ක පොලී ආදායම දෙවතාවක් ගිණුම් ගතකර තිබුණි.

(ඌ). සමාලෝචිත වර්ෂයට අදාල රු.26,728,039 ක් වූ වැටුප් වියදම මූල්‍ය ප්‍රකාශන වල රු.27,301,154 ක් ලෙස රු.573,115 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාල වරිපනම් හා බදු ආදායම වූ රු.8,923,285 ක මුදල තුල ඉඩම් කට්ටි අනුමත කිරීම් වෙනුවෙන් ලද සියයට 1 බදු රු.455,000 ක් ඇතුලත්ව තිබුණි.

### 1.3.2 අසම්භාව්‍ය බැරකම්

සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයන්ට අදාලව සභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.7,092,202 ව තිබුණි. සභාවට අදාල මාසික වාරිකය ලෙස රු.21,451 බැගින් එම අරමුදලට ගෙවනු ලබන මුදල් සභාවේ කුමන සේවකයන්ට අදාලව යන්න සභාව දැනුවත් වී නොතිබුණි.

### 1.3.3 නොසැසඳු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂය යටතේ ගිණුම් විෂයයන් 02 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අනුව වූ අනුරූපී අගයන් අතර රු. 14,622,175 ක නොසැසඳීම් පැවතුණි.

### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ). 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.20,345,322 ක් වූ අතර, ඒයින් රු. 2,900,829 ක්ම වසර 1 - 3 ත් අතර කාලයකට අදාල විය.

(ආ). 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.50,354,354 ක් වූ අතර, ඒයින් රු. 9,034,034 ක්ම වසර 3 කට වැඩි කාලයකට අදාල විය.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු. 93,352,833 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.16,402,197 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.19,942,442 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,540,245 ක පිරිහීමක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.7,948,153 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.11,396,896 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල අතිරික්තය රු.12,953,454 ක් දක්වා අඩුවී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.90,967,289 න් සියයට 45ක් ලෙස රු.41,366,352 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත වන අතර, ප්‍රාග්ධන ආදායම වූ රු.7,948,153 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් වලින් සමන්විත විය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.74,568,091 න් සියයට 63 ක් වූ රු.46,986,449 ක් පෞද්ගලික පඩිනඩි වියදම වූ අතර, ඉන් සියයට 58 ක් වූ රු.27,301,154 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම් ගතකර තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 170 වගන්තිය අනුව වරිපනම් බදු හා අක්කර බදු අදාල බලය පැවරීම් මත ක්ෂේත්‍රයේදී මුදල් එකතු කිරීම කල හැකි අතර වෙළඳ බලපත්‍ර, කඩකුලී, බදුකුලී, ජල ගාස්තු වැනි ආදායම් ක්ෂේත්‍රයේදී එකතු කිරීම සඳහා නගර සභා ආඥා පනත අනුව ලැබී ඇති නිශ්චිත බලය පැවරීමක් සිදුකල හැකි අවස්ථා හඳුනාගත නොහැකි විය.

#### 2.3.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් බදු හිඟය රු.6,572,377 ක් වූ අතර එය වාර්ෂික බිල් කිරීම වූ රු.7,861,983 න් සියයට 83 ක් පමණ විය. සභා බල ප්‍රදේශයේ පැවති වරිපනම් ඒකක 4028 න් වරිපනම් ඒකක 745 ක් සඳහා පමණක් අවසන් නිවේදන නිකුත් කර තිබුණි.

2.3.3 කඩකුලී

සමාලෝචිත වර්ෂය සඳහා සභාවට අයවිය යුතු එකතුව රු.573,068 ක් වූ කඩකුලී ආදායම අයකර ගැනීම සඳහා සභාව විසින් විධිමත් පියවර ගෙන නොතිබුණි.

2.3.4 ජල ගාස්තු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සභාව විසින් මාසිකව ජල ඒකක 25,000 ක් පමණ පවිත්‍ර කර ජල පාරිභෝගිකයින් 1750 ක් වෙත බෙදා හැර තිබුණ ද, එක් එක් පාරිභෝගිකයා විසින් පරිභෝජනය කල ජල ඒකක ප්‍රමාණය හා පොදු පරිභෝජනය සඳහා යොදාගෙන තිබුණු ජල ඒකක ප්‍රමාණය හඳුනාගැනිම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් නොවිය.

(ආ). සමාලෝචිත වර්ෂය අවසානයට ජල ගාස්තු හිඟය රු.2,671,805 ක් වූ අතර 2013 වර්ෂයේ ජනවාරි - ජුලි දක්වා කාලය තුල කිසිදු මුදලක් ගෙවා නොතිබුණු ජල පාරිභෝගිකයින් සංඛ්‍යාව 327 ක් විය. එසේම මාසිකව රු.100 බැගින් ස්ථාවර ගාස්තුවක් පමණක් බිලකල ජල පාරිභොගිකයන් 310 ක් හා ජල සැපයුම් විසන්ධි කල ජල පාරිභෝගිකයින් 86 ක් ද වූ අතර, කුලියාපිටිය පොලිස් නිවාස වලට අදාලව දිගු කාලීනව පැවත එන රු.91,690 ක හිඟ ශේෂයක් විය.

2.3.5 විනෝද බදු

සභා බල ප්‍රදේශය තුල පැවති සිනමා ශාලා දෙකකට අදාල රු.919,482 ක විනෝද බදු හිඟයක් පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධන ඇගයීම

සමාලෝචිත වර්ෂය තුල සභාව ඉටු කිරීමට සැලසුම් කල රු.1,300,000 ක් වටිනා කර්මාන්ත 4 ක් ඉටුකර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සභාව විසින් 2008 සිට 2013 වර්ෂය දක්වා වූ කාලය තුල අනුමත කල ගොඩනැගිලි අයදුම්පත්‍ර සංඛ්‍යාව 196 ක් වූ අතර, අනුකූලතා සහතික ලබා නොගත් ස්ථාන 181 ක් විය. එසේම ගොඩනැගිලි බලපත්‍ර කාලය දීර්ඝ කරවා නොගැනීම පිළිබඳව හෝ අනුකූලතා සහතික නොමැතිව එම ගොඩනැගිලි ප්‍රයෝජනයට ගැනිමට එරෙහිව හෝ සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබු අතර, අනුකූලතා සහතික ගාස්තු හා ප්‍රමාද ගාස්තු අයකිරිම පිළිබඳව විධිවිධාන ද සභාව විසින් ඇතිකරගෙන නොතිබුණි.

(ආ). සභාවට එරෙහිව පවරා තිබුණු නඩුවක් සඳහා සභාව ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒක පාර්ශවීය ලෙස නඩුව විභාග කර පැමිණිලිකරු වෙත රු.500,000 ගෙවීමට නියම වී තිබුණි. සභාව විසින් ඊට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ගොනුකර තිබුණු අතර, ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල රු.55,800 ක නීතිඥ ගාස්තු ගෙවා තිබුණි.

(ඇ) සභාව විසින් මීගහකොටුව ප්‍රදේශයේ අපජලය බැස යන කානුවක් ඉදිකිරීමට එරෙහිව පෞද්ගලික පාර්ශවකරුවෙකු 2006 වර්ෂයේදී පවරා තිබුණු නඩුවක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම විභාග වෙමින් පැවතුණි.

(ඇ). සභාවට අයත් සුභාරතී පුර නව ගම්ගොඩ ව්‍යාපෘතියේ ඉඩමක් රු.362,000 කට තක්සේරු කර පෙර ගෙවුම් මුදල් ක්‍රමයට බඳුදී තිබුණ ද ටෙන්ඩර් මගින් අදාල ඉඩම ලබාගත් පුද්ගලයන්ගේ ලැයිස්තුවක්, අයවූ මුදල් පිළිබඳ ලේඛනයක්, තවදුරටත් අයවිය යුතු ප්‍රමාණය හා අදාල ගොනු සම්බන්ධ තොරතුරු, ඔප්පු ප්‍රදානය කල විස්තර සභාවේ පවතින බවට හඳුනාගත නොහැකි විය. එහෙත් මීට අදාලව සමාලෝචිත වර්ෂයේදී රු.226,845 ක් අයවී ඇති බව ආදායම් හා වියදම් ගිණුමේ දක්වා තිබුණි.

4. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). ආදායම් පරිපාලනය

(ඇ). මූල්‍ය පාලනය

(ඉ). අයවැය පාලනය